# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
තැ. පෙ. අංක 06, නුගේගොඩ, ශ්‍රී ලංකාව

දූ.ක.: +94 112881550, +94 11 5523642 ෆැක්ස්: +94 11 2802551 විද්‍යුත් තැපැල: dr.fgs@sjp.ac.lk


2023.03.20

මහත්මයාණෙනි/ මහත්මියනි,

**<u>අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2023</u>**

උක්ත පාඨමාලාව සඳහා ඔබ විසින් යොමු කරන ලද අයදුම්පත හා බැඳේ.

ඉහත පාඨමාලාව සඳහා අපේක්ෂකයින් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2023.03.25 දින පෙ.ව. 08.30 ට අපරාධ විද්‍යා අධ්‍යයනාංශයෙහි සම්මන්ත්‍රණ ශාලාවේ (Conference Hall) පැවැත්වීමට නියමිත බවත් ඒ සඳහා ඔබගේ පැමිණීම අනිවාර්ය බවත් මෙමගින් කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම පහත ලිපි ලේඛන එදින රැගෙන ඒම ද අනිවාර්ය වේ.

1. අයදුම්පත්‍ර ගාස්තුව වන රු. 2000.00 ගෙවූ බවට රිසිට් පත (මෙම රිසිට්පත් දැනටමත් අප වෙත යොමු කර ඇත්නම් මෙය නොසලකා හරින්න) (payment slip of Application)
2. උප්පැන්න සහතිකයේ මුල් පිටපත හා ඡායා පිටපතක්(Birth Certificate)
3. ජාතික හැඳුනුම්පත හා ඡායා පිටපතක් (NIC )
4. උපාධි සහතිකයෙහි මුල් පිටපත හා ඡායා පිටපතක් (Degree Certificate)
5. විස්තරාත්මක උපාධි සහතික පත්‍රය(Detail Degree Certificate)
6. පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප තුනක් (03) (Passport size Photos)
7. අයදුම්පතෙහි දෘඩ පිටපත ලියාපදිංචි තැපැල වෙත යොමු කර නැත්නම් එය හෝ ලියාපදිංචි තැපැලවෙත යොමු කර ඇත්නම් එහි රිසිට්පත
8. සුදුසුකම් සනාථ කිරීමට සේවා සහතිකයෙහි පිටපතක් අවශ්‍ය වේ නම්
9. විදේශ විශ්වවිද්‍යාලයක උපාධි සහතිකයක් නම් එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමත බවට ලිපියක් ලබා ගෙන තිබිය යුතුය.

සම්මුඛ පරීක්ෂණයෙන් ඔබ සමත් වුවහොත් තෝරාගත් බවට සනාථ කරන ලිපිය එදිනට ඔබ වෙත ලබාදෙන බැවින් සහ ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත හා ශිෂ්‍ය හැඳුනුම්පත මාසයක් තුළ ඔබවෙත ලබා දීමට කටයුතු කළයුතු බැවින් ඔබගේ ලිපිගොනුව එදිනම නිවැරදිව සම්පූර්ණ කර ගැනීමට ඔබගේ සහයෝගය ලබාදෙන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි. (මේ පිළිබඳව ගැටලුවක් ඇතොත් 0112881558 අංකය අමතන මෙන් දන්වා සිටිමි.)

සහකාර ලේඛකාධිකාරී
ලේඛකාධිකාරී වෙනුවට

C.G. Balasooriya
Assistant Registrar
Faculty of Graduate Studies
University of Sri Jayewardenepura